# අවිජ්ජා සූත්‍රය

(අං.නි. vi, 204-208 පිටු)

අවිජ්ජා නමින් හැඳින්වෙන සූත්‍ර කිහිපයක් සූත්‍ර පිටකයෙහි ඇතුළත් වේ. ඒ අතුරින් අද අප විස්තර කරන්නට බලාපොරොත්තු වන්නේ අංගුත්තර නිකායෙහි දසක නිපාතයෙහි යමක වර්ගයෙහි දැක්වෙන අවිජ්ජා සූත්‍රයයි. උපත ලබා සිටින සත්ත්වයා ජරා, ව්‍යාධි, මරණ, ප්‍රිය විප්‍රයෝග, අප්‍රිය සම්ප්‍රයෝග ආදී අනේකවිධ දුක් දොම්නස් විඳියි. මෙම දුක්වලට විවිධ හේතු ඇත. ඒ අතර ප්‍රධාන හේතුව ලෙස බුදුදහමෙහි විස්තර වන්නේ අවිද්‍යාවයි. අවිද්‍යාවේ ස්වභාවයත් එයට මුල්වන කරුණු මොනවාද යන්නත් අවිද්‍යාව දුරු කිරීමට හේතුවන කරුණු පිළිබඳවත් මෙම සූත්‍රයෙහි කරුණු විස්තර වේ.

භාග්‍යවතුන් වහන්සේ සූත්‍රය ආරම්භ කරන්නේ,

***'පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජා ඉතො පුබ්බෙ අවිජ්ජා නාහොසි, අථ පච්ඡා සම්භවී'ති. එවමෙතං භික්ඛවෙ වුච්චති, අථ ච පන පඤ්ඤායති ඉදප්පච්චයා අවිජ්ජා'ති.***

මහණෙනි, මෙයින් පෙර අවිද්‍යාව නොවීය. එයින් පසු පහළ වී යැයි අවිද්‍යාවේ මුල් කෙළවර නොපැනේ. තවද අවිද්‍යාවට ද හේතු පවතී, යනුවෙනි.

අප සසර ගත කළ ආත්භාව පිළිබඳ ව සලකා බැලීමේ දී අතිදීර්ඝ කාලයක් අවිද්‍යාව පදනම් ම සසර භවයෙන් භවය සැරිසරමින් ගමන් කරමින් සිටී. ලොව්තුරා බුදුවරයකුට පවා සත්ත්වයාගේ මුල් කෙළවර දේශනා කොට නිම කළ නොහැකි පරිදි සත්ත්වයාගේ මුල්කෙළවර ඈතට දිව යන බව මෙහි අදහසයි.

අවිද්‍යාව යනු සසර දුක පිළිබඳ ව පවත්නා අනවබෝධයයි. අප අත්විඳින දුක පිළිබඳ අපට යම් අවබෝධයක් පැවැතිය ද ඊට බලපාන බුදුදහමෙහි සඳහන් ගැඹුරු විග්‍රහ අප විසින් මැනැවින් දත යුතු ව ඇත. ධර්මයෙහි අවිද්‍යාව පිළිබඳ ව කරුණු සඳහන් බොහෝ තැන්වල එය විස්තර වන්නේ දුක පිළිබඳවත්, ඊට බලපාන තෘෂ්ණාව පිළිබඳවත්, දුක නැති කිරීම නම් වූ නිවන පිළිබඳවත්, ඊට මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳවත් පවත්නා අනවබෝධය අවිද්‍යාව ලෙසයි. මෙලෙස දුකෙහි යථා ස්වභාවය පිළිබඳ ව අනබෝධය නිසා සත්ත්වයා දුක නැති කිරීම සඳහා විවිධ කටයුතු සිදු කරයි. එහෙත් ඒවා ගැටලුවට සැබෑ විසඳුම් නොවන හෙයින් දුක නැති කිරීම සඳහා සිදු කරන බාහිර ප්‍රතිකර්ම තුළින් සිදුවන්නේ තවතවත් දුක ම වර්ධනය වීමයි.

බුදුදහමට අනුව යමකට මූලික වන එක් හේතුවක් මෙන් ම ඊට බලපාන තවත් හේතු පැවැතිය හැකි ය. මෙහිදී බුදුරජාණන් වහන්සේ අවිද්‍යාවට බලපාන හේතු එකිනෙක විස්තර කරති.

ඒ අනුව,

1. අවිද්‍යාවට හේතුව පංච නීවරණයි.
2. පංචනීවරණවලට හේතුව ත්‍රිවිධ දුශ්චරිතයයි.
3. ත්‍රිවිධ දුශ්චරිතයට හේතුව ඉන්ද්‍රිය අසංවරයයි.
4. ඉන්ද්‍රිය අසංවරයට හේතු ව අසති අසම්පජඤ්ඤයයි.
5. අසති අසම්පජඤ්ඤයට හේතුව අයෝනිසොමනසිකාරයයි.
6. අයෝනිසෝමනසිකාරයට හේතුව අශ්‍රද්ධාවයි.
7. අශ්‍රද්ධාවට හේතුව අසද්ධර්මශ්‍රවණයයි.
8. අසද්ධර්මශ්‍රවණයට හේතුව අසත්පුරුෂ ආශ්‍රයයි.

පංච නීවරණ යනු කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන නිවන වසාලන අකුසල ධර්මයන් ය. ත්‍රිවිධ දුශ්චරිතය යනු කයින්, වචනයෙන්, මනසින් සිදුවන අකුසලයන් ය. එනම් කයින් සිදුවන ප්‍රාණඝාතය, සොරකම හා කාමමිථ්‍යාචාරයත්, වචනයෙන් සිදුවන බොරුකීම,

කේලාම්කීම, එරුෂවචන හා හිස්වචනයත්, මනසින් සිදුවන අභිජ්ඣා, ව්‍යාපාද හා මිථ්‍යාදෘෂ්ටියත් ය. ඉන්ද්‍රිය අසංවරය යනු ඇස, කන, නාසාදී අභ්‍යන්තර ආයතනවලට රූප, ශබ්දා ගන්ධාදී බාහිර අරමුණු පැමිණීමේ දී තම ඉන්ද්‍රිය එම අරමුණු අබියස සංවර කර ගැනීමේ නොහැකියාවයි. අසති අසම්පජඤ්ඤ යනු අසිහියෙන් හා අනුවණින් ක්‍රියා කිරීමයි. ඇස්, කන්, නාසාදිය බාහිරට විවෘත වීමේ දී අසිහියෙන් හා අනුවණින් ක්‍රියා කිරීම මෙමගින් කියැවේ. අයෝනිසෝමනසිකාරය නුනුවණින් මෙනෙහි කිරීමයි. එනම් යමක යථා ස්වභාවය වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ දෑ පිළිබඳ නිත්‍ය - සැප - ආත්ම - සුභ වශයෙන් වරදවා තේරුම් ගැනීමයි. ඊට හේතුව වන්නේ අශ්‍රද්ධාවයි. එනම් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ යථාවබෝධය නැති කමින් ඒ පිළිබඳ ව පැහැදීමක් නොමැතිකමයි. රත්නත්‍රයෙහි ගුණ දන ඒ කෙරෙහි ප්‍රසාදයෙන් ක්‍රියා කිරීම ශ්‍රද්ධාවයි. අශ්‍රද්ධාවට හේතුව බුදුවරයකුගේ දහමක් අසන්නට අවකාශ නොලැබීමයි. ඊට හේතු වන්නේ බුද්ධාදී කල්‍යාණ මිත්‍රයකුගේ, සත්පුරුෂයකුගේ ඇසුරක් නොමැතිකමයි.

කිසියම් පර්වතයක් මුදුනට වැසි වසින විට දිය පහර එක් වී කුඩා දිය පහර මහා දිය පහර කුඩා ගංගා මහා ගංගා ආදිය ක්‍රමයෙන් ජලයෙන් පිරී මහසයුරු පිරෙන්නාක් මෙන් අසත් පුරුෂ ආශ්‍රය ඇති විට ඉහත කරුණු සියල්ල සිදුවන අයුරු දක්වේ. ඒ අනුව අසත්පුරුෂ ආශ්‍රය ඇති විට අසද්ධර්මශ්‍රවණයත්, අසද්ධර්මයෙන් අශ්‍රද්ධාවත්, අශ්‍රද්ධාවෙන් අයෝනිසෝ මනසිකාරයත්, එමගින් අසති අසම්පජඤ්ඤයත්, අසති අසම්පජඤ්ඤයෙන් ඉන්ද්‍රිය අසංවරයත්, ඉන්ද්‍රිය අසංවරයෙන් ත්‍රිවිධ දුශ්චරිතයත්, එයින් පංචනීවරණත් පංචනීවරණ හේතුවෙන් අවිද්‍යාවත් හටගන්නා බව සූත්‍රයෙහි සඳහන් වේ. අවිද්‍යාවට මූලික හේතුව ලෙස මෙහි දක්වා ඇත්තේ අසත්පුරුෂ ආශ්‍රයයි. සියලු දුර්ගුණයන්හි හා දුකෙහි ආරම්භය ලෙස අසත්පුරුෂ ආශ්‍රය දක්වා තිබේ.

ඉන්පසු අවිද්‍යාව සහිත ඉහත හේතු සියල්ල දුරු කිරීමේ මග ද අවිද්‍යා සූත්‍රයෙහි ම සඳහන් කර ඇත. දුක් දුරුකිරීමට ප්‍රධාන හේතුව වන්නේ විද්‍යාමුක්තිය සාක්ෂාත් කර ගැනීමයි. විද්‍යා විමුක්තිය සාක්ෂාත් කර ගැනීමට බලපාන හේතු සාධක අනුපිළිවෙළින් මෙහි දී විස්තර වේ.

ඒ අනුව,

1. විද්‍යාවිමුක්ති සාධනයට හේතුව සත්තබොජ්ඣංගයයි.
2. සත්තබොජ්ඣංගයට හේතුව සතර සතිපට්ඨානයයි.
3. සතර සතිපට්ඨානයට හේතුව ත්‍රිවිධ සුචරිතයයි.
4. ත්‍රිවිධ සුචරිතයට හේතුව ඉන්ද්‍රිය සංවරයයි.
5. ඉන්ද්‍රිය සංවරයට හේතුව සතිසම්පජඤ්ඤයයි.
6. සතිසම්පජඤ්ඤයට හේතුව යෝනිසෝමනසිකාරයයි.
7. යොනිසොමනසිකාරයට හේතුව ශ්‍රද්ධාවයි.
8. ශ්‍රද්ධාවට හේතුව සද්ධර්මශ්‍රවණයයි.
9. සද්ධර්මශ්‍රවණයට හේතුව සත්පුරුෂ ආශ්‍රයයි.

විද්‍යාවිමුක්තිය යනු අවිද්‍යා අකුසලයට ප්‍රතිපක්ෂ කුසලයයි. එනම් චතුරාර්ය සත්‍යය පිළිබඳ ව යථාවබෝධයයි. මේ සඳහා හේතු වන්නේ සත්තබොජ්ඣංගයි. බොජ්ඣංග යනු අවබෝධය සඳහා හේතු වන අංගයි. එනම් සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන අංග හතයි. නිර්වාණාවබෝධය සඳහා ප්‍රධාන වශයෙන් වැඩිය යුතු අංග හතක් ලෙස මෙය දක්වා තිබේ. සත්තබොජ්ඣංග වැඩෙන්නේ සතර සතිපට්ඨානය වැඩීමේ ප්‍රතිඵල වශයෙනි. කාය, වේදනා, චිත්ත, ධම්ම යන හතර, සතර සතිපට්ඨානයට අයත් ය. කෙලෙස් තවන වීර්යයෙන් මනා නුවණින් හා සිහියෙන්, දැඩි ලෝභය හා දොම්නස දුරුකරමින් මෙම අංග හතර තමාගේ සමස්ත ජීවිතයට ම සම්බන්ධ කර ගනිමින් වැඩිය යුතු ය. සතර සතිපට්ඨානයට මුල් වන්නේ කය, වචනය, සිත යන තුන් දොරෙහි මනා හැසිරීමයි. ත්‍රිවිධ සුචරිතය හට ගන්නේ ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රියයන්ගේ සංවරය ඇති විටයි. ඒ සඳහා සිහිය හා නුවණ අවශ්‍ය වේ. එනම් සතිසම්පජඤ්ඤයයි. සතිසම්පජඤ්ඤයට මුල් වන්නේ යෝනිසෝමනසිකාරය හෙවත් නුවණින් මෙනෙහි කිරීමයි. යෝනිසෝමනසිකාරය ඇති වන්නේ තෙරුවන කෙරෙහි ශ්‍රද්ධාව

හෙවත් කරුණු දන ඇති වන පැහැදීම ඇති විටයි. ශ්‍රද්ධාව හටගන්නේ බුදුබණ ශ්‍රවණය කිරීමෙනි. එනම් බුද්ධාදී උතුමකු වෙතින් හෝ උන් වහන්සේගේ ධර්මමාර්ගය පිළිපදින ශ්‍රාවකයකු වෙතින් හේතුඵල ධර්ම සංඛ්‍යාත සැබෑ දහමක් ශ්‍රවණය කිරීමයි. මේ සියල්ලට මුල්වන්නේ කල්‍යාණ ගුණ ඇති සත්පුරුෂ ආශ්‍රයයි. එනම් මග නොමග මැනැවින් කියාදෙන, ධර්මය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ඇති, අන් අය කෙරෙහි කරුණාධ්‍යාශයෙන් ක්‍රියා කරන සත්පුරුෂයකු ඇසුරු කිරීමයි.

සමස්ත බුදුදහමින් ම ප්‍රතිඵල නෙලා ගැනීමටත් සියලු දුක්වලින් සදහට නිදහස් වීමටත් බලපාන ප්‍රධාන සාධකය වන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි. දිනක් ආනන්ද මාහිමියන් වහන්සේ *'ශාසන බ්‍රහ්මචර්යාවෙන් අඩක් ම රඳාපවත්නේ කල්‍යාණමිත්‍රත්වය මත නේද'* යි බුදුරදුන් හමුවෙහි ප්‍රකාශ කර සිටියහ. මෙහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළේ *'ආනන්ද, එසේ ප්‍රකාශ කරන්න එපා, අඩක් නොව ශාසන බ්‍රහ්මචර්යාව සම්පූර්ණයෙන් ම රඳා පවත්නේ කල්‍යාණමිත්‍රත්වය මත ය'* කියායි. ප්‍රමාණවත් ධර්මඥානයකින් හා ඊට අනුකූල පැවැත්මක් සහිත අන් අයට ද කරුණාවෙන් එම දහම කියාදෙන කල්‍යාණ මිත්‍රයකුගේ ඇසුරෙහි ඇති වැදගත්කම මෙයින් පැහැදිලි වේ. කල්‍යාණ මිත්‍රයන් සිටිය යුතුවාක් මෙන් ම එම කල්‍යාණ මිත්‍රයන් හඳුනාගැනීමත් ඔවුන්ට අවනත වීමත් ඔවුන් පවසන දහම අසන්නට සැබෑ ඕනෑකමත් අත්‍යාවශ්‍ය සාධක වේ. කල්‍යාණ මිත්‍රයන් හඳුනා ගැනීමට නම් අප තුළ ද යම් පමණකට හෝ යහපත් ගුණාංග පැවැතිය යුතු ය. ගුණගරුක විය යුතු ය. බුද්ධිමත් විය යුතු ය. එසේ නොවුන හොත් සත්පුරුෂයන් මුණගැසුන ද ඔවුන් හඳුනා ගැනීමට හෝ ඔවුන් වෙතින් යහපත් මාර්ගෝපදේශ ලබා ගැනීමට හෝ අවකාශ අහිමි වී යනු ඇත.

මේ අනුව සත්පුරුෂ ආශ්‍රය ඇති විට සද්ධර්මශ්‍රවණයත්, එමගින් ශ්‍රද්ධාවත්, ශ්‍රද්ධාවෙන් යෝනිසෝමනසිකාරයත්, යෝනිසෝමනසිකාරය ඇති විට සතිසම්පජඤ්ඤයත්, සතිසම්පජඤ්ඤයෙන් ඉන්ද්‍රිය සංවරයත්, ඉන්ද්‍රිය සංවරයෙන් ත්‍රිවිධ සුචරිතයත්, එයින් සතර සතිපට්ඨානයත්, සතර සතිපට්ඨානයෙන් සත්තබොජ්ඣංගත්, සත්තබොජ්ඣංග වැඩීමෙන් විද්‍යාවිමුක්ති සාධනයත් අනුපිළිවෙළින් සිදු වේ.

කන්දක් මුදුනට වැස්ස වසින විට එම ප්‍රදේශයට ම වැසි දිය ලැබී දියඇලි - ගංගා ජලයෙන් සශ්‍රීක ව මුහුද පිරී ඉතිරී යන්නාක් මෙන් සත්පුරුෂ ආශ්‍රය ඇති විට ජීවිතයේ දුර්ගුණ නමැති වියැලි තැන් ගුණ නැණින් තෙත් වී නිවන සඳහා වැඩිය යුතු සත්ත බොජ්ඣංග සංඛ්‍යාත සියලු අංග සම්පූර්ණ වී ශ්‍රාවකයා නිවන නමැති මහසයුර වෙත රැගෙන යයි. අවිජ්ජා සූත්‍රයෙන් අපට මග පෙන්වන්නේ අවිද්‍යාව ඇතිවීමට බලපාන හේතු සහ අවිද්‍යාව ප්‍රහීණ කිරීමට බලපාන සාධකයි. එනම් සසරත්, නිවනත් යන දෙක ම මෙමගින් විස්තර වේ. දීර්ඝ විස්තරයකින් දැක්විය යුතු දහම් මගක් මෙයින් ඉතා සංක්ෂිප්ත ව විස්තර වේ. එම නිසා අප සැවොම මෙම දහම් මග ඉගෙන එය අපගේ ජීවිතවලට වඩාත් උනන්දුවෙන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ ගනිමු. ඒ සඳහා ඔබ සැමට තෙරුවන් බෙලෙන් නිදුක් නීරෝගී සුව දිගාසිරි සම්පත් ලැබේවායි ඉත සිතින් පතමි.

*එවමෙව ඛො භික්ඛවෙ සප්පුරිසසංසෙවො පරිපූරො සද්ධම්මසවනං පරිපූරෙති, සද්ධම්මසවනං පරිපූරං සද්ධං පරිපූරෙති, සද්ධා පරිපූරා යොනිසොමනසිකාරං පරිපූරෙති, යොනිසොමනසිකාරො පරිපූරො සතිසම්පජඤ්ඤං පරිපූරෙති, සතිසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියසංවරං පරිපූරෙති, ඉන්ද්‍රියසංවරො පරිපූරො තීණි සුචරිතානි පරිපූරෙති, තීණි සුචරිතානි පරිපූරානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති, චත්තාරො සතිපට්ඨානා පරිපූරා සත්තබොජ්ඣංගෙ පරිපූරෙන්ති, සත්තබොජ්ඣංගා පරිපූරා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. එවමෙතිස්සා විජ්ජාවිමුත්තියා ආහාරො හොති, එවඤ්ච පාරිපූරීති.*

( මොරිනෝ වැලිහි ශ්‍රී සම්බුද්ධාලෝක බෞද්ධ විහාරය -
බු.ව. 2560 පොසොන් සීල භාවනා වැඩසටහන - 6/18/2016)